# ලංකාණ්ඩුවේ "ගැසට්" පත්‍රය.

ආණ්ඩුවේ අවසරයපිට ප්‍රසිද්ධකරණලදී.

නො. 7,464 — 1925ක්වූ මැයි මස 29වෙනි දිනවූ සිකුරාද.

## Part IV. — හතරවෙනි කාණ්ඩය.

---

### ආණ්ඩුකාර උතුමාණන්වහන්සේ විසින් දෙවාවදාරණලද ප්‍රකාශපත්‍රයයි.

මහා බ්‍රිතාන්‍යය සහ අයර්ලන්තයෙන් සැදි එක්සත් රාජ්‍යයෙහි මුහුදින් එතර බ්‍රිතාන්‍ය අණසකට ඇතුළත් රටවලද රජයලත් සමය සංරක්ෂකවූ නෛකශ්‍රීන් විරාජමාන පස්වෙනි ජෝර්ජ් මහා රාජෝත්තමයාණන්වහන්සේගේ නාමයෙන්.

ශ්‍රී ලංකාද්වීපයට හා ඊට අයත් ප්‍රදේශයන්හි ආණ්ඩුව කරණ මයිකල් ජෝර්ජ් යන ශුද්ධවරයින්ගේ
අතිවිශිෂ්ට පඞ්කතියෙහි සහායක ධූරන්ධර සිසිල් ක්ලෙමෙන්ති
උතුමාණන්වහන්සේ විසින් දෙවාවදාළ

ප්‍රකාශපත්‍රයයි.

සිසිල් ක්ලෑමෙන්ති.

වර්ෂ 1917ක්වූ අවුරුද්දේ අඞ්ක 34 දරන ආඥාපණතින් අමුතුකරනලැබූ 1907හේ අඞ්ක 8 දරණ ආඥාපණතේ 19 වන 20 වන වගන්තිවලට අනුව ඌවේ දිස්ත්‍රික් පාඨශාලා සභාව විසින් සාදනලද උපනීති වර්ෂ 1909ක්වූ සැප්තැම්බර් මස 3වෙනි දින අඞ්ක 6,326 දරණ ආණ්ඩුවේ ගැසැට් පත්‍රයෙහි පළමු වර්ෂ 1909ක්වූ සැප්තැම්බර් මස 2වෙනි දින දරන ප්‍රකාශ පත්‍රයකින් ඒවා ස්ථිරකරනලද "B" ලේඛනයෙහි විස්තරකරනලද භූමිභාගයතුළ ඇතිවූ පාඨශාලා පිළිබඳව වලංගුවට පැමිණි බැවින්ද.

එකී "B" ලේඛනය අමුතුකර වෙනස්කිරීම උවමනායයි ඌවේ දිස්ත්‍රික් පාඨශාලා සභාවට ඒත්තුවී තිබෙන බැවින්ද.

එකී ආඥාපණතේ 20 වන වගන්තියේ 2 වන අනුවගන්තියෙන් ලංකාණ්ඩුව කරන අප කෙරෙහි පැවරීතිබෙන බලය අනුව ක්‍රියාකිරීමේදී අප විසින් කාරක මන්ත්‍රී සභාවේ අනුමතියත් ඇතුව මීට යාකරනලද ලේඛනයේ මුලකට්ටියේ සඳහන් එකී B ලේඛනය මෙම ප්‍රකාශ පත්‍රයෙන් අවලංගුකොට මීට යාකරනලද ලේඛනයේ දෙවෙනි කට්ටියේ පෙන්නුම්කරන පරිදි අලුත් B ලේඛනය මෙහි දින පටන් බලය ඇතුව ඒ වෙනුවට යොදන බව දැනගනිත්වා.

අපගේ ස්වාමින්වහන්සේගේ වර්ෂයෙන් එක්වාදහස් නවසිය විසිපහක්වූ මැයි මස නව වන මෙදින ලංකාද්වීපයේ කොළඹදී දෙවාවදාරනලදී.

උතුමාණන්වහන්සේගේ අණපරිදි,

ජී. බී. ඇලෙක්සැන්ඩර්,
වැඩබලන මහලේකම්තාරිස් විසින්

අපරජතුමන් දෙවියෝ රකිත්වා.

## "B" ලේඛනය.

පාඨශාලාව පිහිටි ගම සහ විස්තර.

### ගම්කිඳ පලාත.

දික්වැල්ල ආණ්ඩුවේ ස්වභාෂා පාඨශාලාව
කුඹල්වෙල ආණ්ඩුවේ ස්වභාෂා පාඨශාලාව
උඩවෙල වැස්ලියන් මෙතොදිස්ත සමාගමේ පාඨශාලාව
සිඳගොඩ වැස්ලියන් මෙතොදිස්ත සමාගමේ පාඨශාලාව
බැද්දේගම එංගලන්ත සභාවේ පාඨශාලාව
පස්සර ආණ්ඩුවේ ස්වභාෂා පාඨශාලාව
ලුනුගල ආණ්ඩුවේ ස්වභාෂා පාඨශාලාව

### උඩුකිඳ පලාත.

ඇටම්පිටිය ආණ්ඩුවේ ස්වභාෂා පාඨශාලාව
වැලිමඩ ආණ්ඩුවේ ස්වභාෂා පාඨශාලාව
පාලුගම ආණ්ඩුවේ ස්වභාෂා පාඨශාලාව
මැදවෙල ආණ්ඩුවේ ස්වභාෂා පාඨශාලාව
බලගල වැස්ලියන් මෙතොදිස්ත සමාගමේ පාඨශාලාව
ගම්පහ වැස්ලියන් මෙතොදිස්ත සමාගමේ පාඨශාලාව
වංගියකුඹුරේ ආණ්ඩුවේ ස්වභාෂා පාඨශාලාව

### වියලුව පලාත.

සොරණතොට ආණ්ඩුවේ ස්වභාෂා පාඨශාලාව
කල්දෙන වැස්ලියන් මෙතොදිස්ත සමාගමේ පාඨශාලාව
තැන්නේපංගුව ආණ්ඩුවේ ස්වභාෂා පාඨශාලාව
බෙරමඩ ආණ්ඩුවේ ස්වභාෂා පාඨශාලාව
මීගහකිවුල ආණ්ඩුවේ ස්වභාෂා පාඨශාලාව

### වෙල්ලස්ස පලාත.

පොල්ගහගම ආණ්ඩුවේ ස්වභාෂා පාඨශාලාව
අම්බගල්ල එංගලන්ත සභාවේ පාඨශාලාව
සියඹලාඅඬුව ආණ්ඩුවේ ස්වභාෂා පාඨශාලාව
කොටබෝව ආණ්ඩුවේ ස්වභාෂා පාඨශාලාව
මැදගම එංගලන්ත සභාවේ ස්වභාෂා පාඨශාලාව
නන්නාපුරව වැස්ලියන් මෙතොදිස්ත සමාගමේ ස්වභාෂා පාඨශාලාව
බිබිලේ වැස්ලියන් මෙතොදිස්ත සමාගමේ ස්වභාෂා පාඨශාලාව
බදුලුවෙල ආණ්ඩුවේ ස්වභාෂා පාඨශාලාව
ඇල්කුඹුර වැස්ලියන් මෙතොදිස්ත සමාගමේ පාඨශාලාව

### බුත්තල පලාත.

බඩල්කුඹුර ආණ්ඩුවේ ස්වභාෂා පාඨශාලාව
ඔක්කම්පිටිය ආණ්ඩුවේ ස්වභාෂා පාඨශාලාව
වැදිකුඹුර ආණ්ඩුවේ ස්වභාෂා පාඨශාලාව

### වැල්ලවාය පලාත.

තලපතන ආණ්ඩුවේ ස්වභාෂා පාඨශාලාව
හල්දුම්මුල්ල වැස්ලියන් මෙතොදිස්ත සමාගමේ ස්වභාෂා පාඨශාලාව
කොස්ලන්ද ආණ්ඩුවේ ස්වභාෂා පාඨශාලාව
වැල්ලවාය ආණ්ඩුවේ ස්වභාෂා පාඨශාලාව
බෝදගම ආණ්ඩුවේ ස්වභාෂා පාඨශාලාව

### බින්තැන්න පලාත.

අලුත්නුවර ආණ්ඩුවේ ස්වභාෂා පාඨශාලාව
හොබරිව ආණ්ඩුවේ ස්වභාෂා පාඨශාලාව
ඊරාණිය ආණ්ඩුවේ ස්වභාෂා පාඨශාලාව
බලදන්ගොල්ල ආණ්ඩුවේ ස්වභාෂා පාඨශාලාව

## ඉහතින්කී පැවුල් පත්‍රය.

## "අලුත් 'B'" ලේඛනය.

### ආණ්ඩුවේ පාඨශාලා.

#### උඩුකිඳ පලාත.

1. ගම්පහ ස්වභාෂා පිරිමි පාඨශාලාව
2. තුප්පිටියේ ස්වභාෂා පිරිමි පාඨශාලාව
3. ලුනුවත්තේ ස්වභාෂා පිරිමි පාඨශාලාව
4. මැදවෙල ස්වභාෂා පිරිමි පාඨශාලාව
5. පාලුගම ස්වභාෂා පිරිමි පාඨශාලාව
6. ඇටම්පිටියේ ස්වභාෂා පිරිමි පාඨශාලාව
7. උඩපේරුවේ ස්වභාෂා මිශ්‍ර පාඨශාලාව
8. වැලිමඩ ස්වභාෂා පිරිමි පාඨශාලාව
9. වංගියකුඹුරේ ස්වභාෂා පිරිමි පාඨශාලාව
0. කුරුනලාවේ දෙමළ පාඨශාලාව
11. හපුතලේ ස්වභාෂා පිරිමි පාඨශාලාව

#### ගම්කිඳ පලාත.

1 ලුනුගල ස්වභාෂා පිරිමි පාඨශාලාව
2. පස්සර ස්වභාෂා මිශ්‍ර පාඨශාලාව
3. බිබිලේගම ස්වභාෂා මිශ්‍ර පාඨශාලාව
4. දික්වැල්ලේ ස්වභාෂා මිශ්‍ර පාඨශාලාව
5. කුඹල්වෙල ස්වභාෂා මිශ්‍ර පාඨශාලාව
6. ස්ප්‍රිංවැලිවත්තේ දෙමළ පාඨශාලාව
7. මොනකෝම්බවත්තේ දෙමළ පාඨශාලාව

#### වියලුව පලාත.

1. සොරණතොට ස්වභාෂා මිශ්‍ර පාඨශාලාව
2. තැන්නේපංගුවේ ස්වභාෂා මිශ්‍ර පාඨශාලාව
3. බෙරමඩ ස්වභාෂා පිරිමි පාඨශාලාව
4. මීගහකිවුලේ ස්වභාෂා මිශ්‍ර පාඨශාලාව
5. පල්ලේවෙල ස්වභාෂා පිරිමි පාඨශාලාව
6. කන්දේගෙදර ස්වභාෂා මිශ්‍ර පාඨශාලාව
7. මොරහෙල ස්වභාෂා පිරිමි පාඨශාලාව

#### වෙල්ලස්ස පලාත.

1. මල්ලේහැව ස්වභාෂා පිරිමි පාඨශාලාව
2. පිටකුඹුර ස්වභාෂා පිරිමි පාඨශාලාව
3. ගොඩිගොමුවේ ස්වභාෂා පිරිමි පාඨශාලාව
4. මැදගම ස්වභාෂා පිරිමි පාඨශාලාව
5. පොල්ගහගම ස්වභාෂා පිරිමි පාඨශාලාව
6. බදුලුවෙල ස්වභාෂා පිරිමි පාඨශාලාව
7. සියඹලාඅඬුව ස්වභාෂා පිරිමි පාඨශාලාව
8. බකිනිගහවෙල (මුස්ලිම්) දෙමළ පාඨශාලාව

#### බුත්තල පලාත.

1. බඩල්කුඹුරේ ස්වභාෂා පිරිමි පාඨශාලාව
2. අලුපොත (මුස්ලිම්) දෙමළ පාඨශාලාව
3. මුප්පනේ හෙවත් මේනගල ස්වභාෂා මිශ්‍ර පාඨශාලාව
4. වැදිකුඹුරේ ස්වභාෂා පිරිමි පාඨශාලාව
5. ඔක්කම්පිටියේ ස්වභාෂා පිරිමි පාඨශාලාව
6. බුත්තල ස්වභාෂා පිරිමි පාඨශාලාව
7. ශිරිමලේ ස්වභාෂා පිරිමි පාඨශාලාව

#### වැල්ලවාය පලාත.

1. තලපතන ස්වභාෂා මිශ්‍ර පාඨශාලාව
2. කොස්ලන්දේ ස්වභාෂා පිරිමි පාඨශාලාව
3. වැල්ලවායේ ස්වභාෂා පිරිමි පාඨශාලාව
4. බෝදගම ස්වභාෂා පිරිමි පාඨශාලාව
5. හම්බේගමුවේ ස්වභාෂා පිරිමි පාඨශාලාව

#### බින්තැන්න පලාත.

1. අලුත්නුවර ස්වභාෂා පිරිමි පාඨශාලාව
2. ඊරණියේ ස්වභාෂා පිරිමි පාඨශාලාව
3. බලදන්ගොල්ලේ ස්වභාෂා පිරිමි පාඨශාලාව
4. ඇකිරියන්කුඹුරේ ස්වභාෂා පිරිමි පාඨශාලාව
5. අරාවේ ස්වභාෂා පිරිමි පාඨශාලාව

### ආධාර ලබන සහ වෙනත් පාඨශාලා.

#### උඩුකිඳ පලාත.

1. බිස්දුන්දේ (බලගල) වැස්ලියන් සමාගමේ මිශ්‍ර පාඨශාලාව
2. පාලුගම වැස්ලියන් සමාගමේ ගැහැණු පාඨශාලාව
3. වැලිමඩ වැස්ලියන් සමාගමේ ගැහැණු පාඨශාලාව
4. හපුතලේ චර්ච් මිෂනාරි සමාගමේ මිශ්‍ර පාඨශාලාව
5. "අශෝක" බෞද්ධ සමාගමේ පාඨශාලාව (ඉංගිරිසි දෙපාර්තමේන්තුවෙන් පිළිගත් පාසැල

#### ගම්කිඳ පලාත.

1. අලුත්වෙලගම වැස්ලියන් සමාගමේ මිශ්‍ර පාඨශාලාව
2. බැද්දේගම එංගලන්ත සභාවේ ස්වභාෂා පිරිමි පාඨශාලාව
3. උඩවෙල වැස්ලියන් සමාගමේ මිශ්‍ර පාඨශාලාව

#### වියලුව පලාත.

1. කල්දෙන වැස්ලියන් සමාගමේ පාඨශාලාව

#### වෙල්ලස්ස පලාත.

1 බිබිලේ වැස්ලියන් සමාගමේ පාඨශාලාව
- නන්නාපුරවේ වැස්ලියන් සමාගමේ පාඨශාලාව

#### වැල්ලවාය පලාත.

1. හල්දුම්මුල්ලේ වැස්ලියන් සමාගමේ පාඨශාලාව

---

## "වර්ෂ 1898වේ ලෝකල් බෝඩ් ආඥාපණත."

වර්ෂ 1916යේ අංක 27 දරන ආඥාපණතින් අලුත්කරනලද වර්ෂ 1898වේ අංක 13 දරන ආඥාපණතේ 56වෙනි වගන්තිය අනුව එකී වගන්තිය යටතේ ත්‍රිකුණාමලේ ලෝකල් බෝඩ් සභාව විසින් සාදනලදුව කාරක මන්ත්‍රී සභාවේ අනුශාසනය ඇතුව ආණ්ඩුකාර උතුමාණන්වහන්සේ විසින් ස්ථිරකරනලද මෙහි පහත දක්වන අතුරුපණත් මහජනයාගේ දැනගැන්ම සඳහා ප්‍රසිද්ධකරනු ලැබේ.

උතුමාණන්වහන්සේගේ අණපරිද්දෙන්,
ඒ. බී. ඇලැක්සැන්ඩර්,
වැඩබලන මහලේකම් ධම්හ.

වර්ෂ 1925ක්වූ මැයි මස 11වෙනි දින කොළඹ
මහලේකම්තැනගේ කන්තෝරුවේදිය.

### සදහන්කරනලද අතුරුපණත්.

#### A.—සාමාන්‍ය කරුණු.

1. සභා සීමාවතුළ අවුරුද්දපතා දෙන අවසරපත්‍රයක් නොමැතිව පාන්ගෙවල්, බත්කඩ, තේ හෝ කෝපිකඩ කිරිපට්ටි, අනුල්ලන ස්ථාන හෝ ප්‍රසිද්ධ නවාතැන්පලවල් කිසිවෙකුට තබාගත නොහැකිය. මෙහි පහත සදහන්වෙන හෝ සභාවේ දැනට පවතින්නාවූ අණපණත් ප්‍රකාරයට කටයුතු සූදානම් නොකරන්නාවූ අයට අවසරපත්‍ර නොදීමට සභාපතිතැනට බලය තිබේ. එවැනි අවසරපත්‍ර ඒ ඒ අවුරුද්දවල දෙසැම්බර් මස 31වෙනි දින දක්වා හෝ ඒවා අවලංගුකරනතුරු එම අවසරපත්‍රවලට බලය තිබේ. තවද එකී අවසරපත්‍රවලට මන්ත්‍රණ සභාවේ උතුමාණන්වහන්සේගේ අනුමැතිය සිට සභාව විසින් කලින්කල නියමකරන මුදලක් ගෙවිය යුතුයි.

2. ඉහතකී ස්ථාන සම්බන්ධව මෙහි පහත සදහන්වන හෝ සභාවේ පවතින්නාවූ අණපණත්වලින් යම් එකක් කඩකිරීමෙන් දෙවතාවක් හෝ ඊට වැඩිගණනක් උසාවියක යමෙක් වැරදිකාරයෙක් වූයේනම් දෙවෙනි හෝ ඊට පසු වැරද්ද නියම කරන්නාවූ උසාවියකට සභාපතිතැන විසින් මෙම පරිච්ඡේදයේ ප්‍රකාර දෙනලද එම අවසරපත්‍ර අවලංගුකිරීමට බලය තිබේ. එසේ උසාවියකින් අවසරපත්‍ර අවලංගුකරනලද යමෙකුට නැවත අවසරපත්‍ර නොදීමට සභාපතිතැනට බලය තිබේ. තවද දේපාඩු සභාවක් විසින් පිහිටුවනලද හෝ එය බාරේ තිබෙන ප්‍රසිද්ධ වෙළඳපොළේ කඩවලට මෙම නීති අදාළ නොවේන්.

## B.—පාන් ගෙවල්.

3. පාන්ගෙය යන්නෙන් මනුෂ්‍යයාගේ ආහාරය පිණිස විකිණීමට පාන්, බිස්කෝතු හෝ පැණිරස කෑම සාදන්නාවූ ඕනෑම ස්ථානයක් හඟවයි. තවද එබඳු ආහාර සෑදීමට සූදානම්කරනු ලබන හෝ එබඳු ආහාර සූදානම්කිරීමට උවමනා ද්‍රව්‍යයන් රැස්කර තබන්නාවූද කොයිම ස්ථානයක් වුවත් ඊට අන්තර්ගතවේ.

4. පාන්පිටි අනන කාමරය ඉතාම අඩුගණනේ පළල අඩි 12ක් සහ දිග අඩි 15වකින් සම්පූර්ණවිය යුතුයි. මනා වාතාශ්‍රය ඇතිවීම පිණිස අඩුගණනේ දෙපැත්තකින්වත් පළල අඩි 7ට අඩුනොවන අවකාශ ස්ථාන පිටතින් ඇතිවියයුතුයි. පෝරනුවේ දොර පිටි අනන කාමරය කෙලින් නොහද්දමියයුතුය. සෑම පිටි අනන කාමරයකටම උඩුවියනක් (සීලිං) ඇතිවිය යුතුයි.

5. සෑම පාන්ගෙයකටම වාතාශ්‍රය සහ ආලෝකය යහපත්සේ තැබිය යුතුයි. සෑම කොටස්ම භිත්ති උස අඩි 7කින් අඩු නොවන ගඩොල්, ගල් හෝ කබුක්වලින් බැඳිය යුතුයි එහි ඇතුළ හුණෙන් කපරාරුකර හයමාසයකට වරක් සුදුහුනු ගෑ යුතුයි. වහල බොහෝ කාලයක් පවතින ද්‍රව්‍යයකින් සෑදියයුතුයි. සිලිම අවුරුද්දකට හතරසැරයක් බැගින් කපරාරුකර සුදුහුනු ගෑයුතුයි. නැතහොත් එය වාර්නිස්කරපු හෝ තීන්ත ගානලද ලෑලි ඉතා කිට්ටුවෙන් වද්දවා සෑදීමට පුළුවන. ගෙබිම සෑමතැන්හි සිමෙන්ති දමා සෑහෙන පමණ කාණුවලින් යුක්තවිය යුතුයි. ඇරීමට හැකිවූද ගෙබිමේ ප්‍රමාණයෙන් දහයෙන් පංගුවකට අඩුනොවන සම්පූර්ණ විශාලකමක් ඇතිවූද ජනේල සෑම කාමරයටම තැබිය යුතුයි.

6. පාන් සහ කැවිලි සාදන්ට පාවිච්චිකරන සියළුම භාජන ඉතාම පිරිසිදුව තිබියයුතුයි. තවද ඒවා ගෙබිම සුඩකරන විට ඉවත්කිරීමටද හැකිවිය යුතුයි.

7. අඩුගණනේ පැය විසිහතරකට වරක් බැගින්වත් ගෙබිම පරීක්ෂා සහිතව සූරා අතුගෑම කළයුතුයි. තවද එම කුණුකසල දිය කාන්දුනොවන වසනලද භාජනයකට එම ඇසිල්ලේම දමා දිනපතා පාන්ගෙයින් පිටතට ගෙණියා යුතුයි.

8. සෑම පාන්ගෙයම පිරිසිදු අන්දමේ තැබිය යුතුයි. තවද සානු, වැසිකිළි හෝ අනිකුත් කුණුකසලින් නැගෙන අශුබ වාතයෙන් තොරවිය යුතුයි.

9. කිසිම පාන්ගෙයක් වැසිකිළියකින් හෝ පෝරගොඩකින් හෝ ඇරතිබෙන කුණුවලකින් අඩි පණහක් ඇතුළත නොතැබිය යුතුයි.

10. පාන් සෑදීමට ඕනෑකරන දේවල් හැර වෙන කිසිම බඩුවක් හෝ ද්‍රව්‍යයක් පාන්ගෙය තුළ නොතැබිය යුතුයි.

11. මේසවල් මුදුන් හොඳකාර මෝරපු කිට්ටුකර වද්දනලද ලෑලිවලින් හෝ අන්තරාය රහිත දිය කාන්දුනොවන වෙන යම් ද්‍රව්‍යයකින් සෑදිය යුතුයි. තවද ඒවා දිනපතා සූරා සුඩකළ යුතුයි.

12. කොයිම කාරණයක් හේතුකොටගෙන කිසිම සතෙක් පාන්ගෙයක තබානොගත යුතුයි.

13. බෝවෙන රෝගයකින් නොහොත් වසංගත රෝගයකින් පෙළෙන්නාවූ හෝ පාන්ගෙයක භාරකාරයා දැනුවත්ව බෝවෙන රෝගයකින් නොහොත් වසංගත රෝගයකින් ළඟදී පෙළිසිටියාවූ හෝ එවැනි රෝගයකින් පෙළෙන අයෙකුට සාත්තුකිරීමෙහි ළඟදී යෙදීසිටියාවූ කෙනෙකුට පාන්ගෙයකට ඇතුල්වීමට හෝ පාන් බිස්කෝත්තු වෙන කිසියම් එවැනි කෑම ද්‍රව්‍යයන් සෑදීම සම්බන්ධ කිසියම් වැඩක් කිරීමට හෝ විකිණීමට පාන්ගෙයක භාරකාරයෙකු විසින් අවසර නොදිය යුතුයි.

14. පාන් සෑදීමේ හෝ පිළිස්සීමේ යෙදීසිටින සියලුදෙනාම පාන් සෑදීම පටන්ගන්ට පෙර අත් සෝදාගෙණ පපුව සහ ශරීරය වැසෙන අන්දමේ පිරිසිදුවූ සුදු වැස්මක් සහ සුදු කැප්එකක් හෝ තලප්පාවක් ඇන්ද යුතුයි.

15. පාන් බිස්කෝත්තු සහ රසකැවිලි සෑදීමෙහි යෙදී සිටින්නන්ගේ පාවිච්චියට හොඳ වතුර සහ සබන් සපයා තැබිය යුතුයි.

16. විකිණීමට තබන සියළුම පාන් බිස්කෝත්තු සහ රස කැවිලි ජාති මැස්සන්ට ඇතුල්වෙන්ට නුපුළුවන් නිසි ලෙස සාදනලද වීදුරු පෙට්ටිවල තැබිය යුතුයි. පෙට්ටි ඉතාම පිරිසිදුව තැබිය යුතුයි.

17. පාන් සෑදීමට ගන්නා පිටි වතුර සහ අනිත් ද්‍රව්‍යත් යහපත් ඒවා වියයුතුයි. තවද බිමෙන් අඩි 3ක් උස්කොට සාදනලද උස් ස්ථානයක පිටි තැබිය යුතුයි.

18. පාන් පුළුස්සන ගෙවල්වලට අයිති මිදුල්වල තිබෙන කසල සියල්ලම දිනපතා ඉවත්කළ යුතුයි කාණුද හොඳකාර වතුර ගසා සේදිය යුතුයි.

19. පාන්ගෙයි මට්ටමට ඇත්තාවූද, එම ගොඩනැගිල්ලේ කොටසක් වන්නාවූද කිසිම ස්ථානයක බිමේ පටන් සිලිම දක්වා පැතිර තිබෙන ක්‍රමයකින් පාන්ගෙයින් හරියාකාර වෙන්කර නැත්නම් එය නිදාගැනීමට පාවිච්චි නොකළ යුතුයි. මුත්‍රා කොටුවක්, වැසිකිළියක්, මුත්‍රාදිය එකතුකර දැමීමට හෝ එකතුවීම පිණිස සාදනලද වළක් පාන්ගෙය ඇතුළේ හෝ ඊට සම්බන්ධකර හෝ නොතැබිය යුතුයි

20. සෑම සුදුසු වේලාවලටද, පාන් පිළිස්සීම කරන්නාවූ ඕනෑම විටකද පාන්ගෙට හෝ පාන් විකිණීමට තබාතිබෙන්නාවූ ස්ථානයට ඇතුල්වී ලෝකල් බෝඩ් සභාවේ ලේකම්තැන විසින් හෝ පරීක්ෂකතැන විසින් සභාපතිතැන විසින් ලියවිල්ලකින් බලයදෙනලද වෙන කෙනෙකු විසින් හෝ පරීක්ෂාකිරීමට නීතියේ ආකාර බලය තිබේ.

21. මේ ආඥාපණත්වල පිටපතක් රාමුවක දමා සෑම පාන් ගෙවල්වලම හොඳින් පෙනෙන ස්ථානයක එල්ලා තිබිය යුතුයි.

## C.—භොජනශාලා තේ හෝ කෝපිකඩ.

22. සියලුම භොජනශාලා, තේ හෝ කෝපිකඩ සභාපතිතැන සතුටුවන අන්දමේ පිරිසිදුවූද සනීපාරක්ෂක විධියටද තැබිය යුතුයි.

23. යම්කිසි භොජන ශාලාවකට හෝ තේ හෝ කෝපිකඩයකට අයිතිවූ හෝ ඒවායේ පාවිච්චියට ගනුලබන භාජන, අරුමෝසම් බඩු සහ අනිකුත් උවමනා ද්‍රව්‍යයන් නිරන්තරයෙන්ම පිරිසිදුව තැබිය යුතුයි.

24. සියලුම භොජන ශාලා තේ හෝ කෝපිකඩවල භිත්ති කපරාරුකර අඩුගණනේ අවුරුද්දකට දෙවරක් සුදුහුනු ගෑ යුතුයි. තවද කාමර යහපත්සේ වාතාශ්‍රයෙන් සහ ආලෝකයෙන්ද යුක්ත කළයුතුයි.

25. යම්කිසි භොජන ශාලාවක හෝ තේ හෝ කෝපිකඩයක මිදුල්වල සහ ඒ අවට තිබෙන සියලුම කුණු සහ කසල දවසකට දෙවරක් බැගින් ඉවත දැමිය යුතුයි.

26. බෝවන රෝගයකින් පෙළෙන්නාවූ හෝ භොජන ශාලාව හෝ තේ හෝ කෝපිකඩය භාරව සිටින තැනැත්තා දැනුවත්ව බෝවන රෝගයකින් ළඟදීම පෙළීසිටියාවූ හෝ එවැනි රෝගයකින් පෙළෙන අයෙකුට සාත්තුකිරීමෙහි ළඟදී යෙදීසිටියාවූ කෙනෙකු එවැනි භොජන ශාලාවේ හෝ තේ හෝ කෝපිකඩේ ඇතුළේ හෝ ඒ අවට වැඩෙහි නොයෙදිය යුතුයි.

27. එවැනි ස්ථානයන්හි පාවිච්චිකරන සීනි වීදුරුමූඩිගසනලද පළල් කටවල් ඇති බෝතලවල තැබිය යුතුයි.

28. විකිණීමට තබනලද සියලුම කේක් රසකැවිලි යනාදිය මැස්සන්ගෙන් නිදහස්කොට නිසිලෙස සාදනලද වීදුරු පෙට්ටිවල තැබිය යුතුයි කිසිම කෑම ද්‍රව්‍යයක් මැස්සන් විසින් අපිරිසිදු කරනුලැබීමට නොහැරිය යුතුයි. පාවිච්චිකරනු ලබන වීදුරුපෙට්ටි ඉතා පිරිසිදුව තැබිය යුතුයි.

29 අහකයන තේ, කෝපි හෝ කිරි නොහොත් කෑමවල ඉතිරි කෑබලි නොහොත් පිසීමේදී අහකයන ද්‍රව්‍යයන් ඒට නිසි භාජනයක එක්කාසුකර දිනපතාම ඉහත්කරනුම්හ භූමියෙන් පිසිනොකළ යුතුයි.

30 කිසිම භෝජන ශාලාවක හෝ තේ හෝ කෝපිකඩයක කලවම් කිරි විකිණීම, ගන්නට කීම, විකිණීමට තැබීම හෝ ඒවා එහි ඇතුළත තබාගැනීම නොකළ යුතුයි.

මේ අනුරූපණත අනුව කලවම් කිරියකි කියන්නේ වතුර හෝ අන්‍ය දිය රෙහෝ වෙන ද්‍රව්‍යයක් මිශ්‍රකිරීම නිසා බීමට නුසුදුසුවූ කිරිවේ.

31. මේ අණපණත් රාමුවක දමා සෑම භෝජන ශාලාවේ හෝ තේ හෝ කෝපිකඩේ හරියාකාර පෙනෙන ස්ථානයක එල්ලා තැබිය යුතුයි.

D.—කිරිවෙළඳාම්පළවල්.

32. 56 (5) යන වගන්තිය යටතේ තිබෙන අනුරූපණත් උදෙසා කිරිවෙළඳාම්පළ යන්නෙහි කිරි සපයනු ලබන්නාවූද විකිණීම පිණිස කිරි තබා තිබෙන්නාවූද යම්කිසි ගවයන් ඇතිකරන ස්ථානයක්, ගවයන් ඇතිකරන ස්ථානයක ඇති ගෙයක් එළදෙනුන් බඳින මඩුවක්, කිරිගබඩාවක් කිරිකඩයක් හෝ කිරිසපයන අන්කිසියම් ස්ථානයක් හගවන්නේය. "කිරිකාරයා" යන්නෙන් යම් එළදෙනුන් ඇතිකරන්නෙක් කිරි ගෙනයන්නෙක් හෝ කිරිවෙළඳාම්පළක පදින්චිකාරයෙක් අනාගීතවේ. තවද කිරිවෙළඳාම්පලක් එක්කෙනෙකුට වඩා වැඩිගණනකට අයිතිවී තිබේනම් එවැනි අවස්ථාවන්හිදී වැඩි එවැනි කිරිවෙළඳාම්පළේ කළමනාකාරයා හෝ එහි සැබවින්ම කළමනාකරන වෙන අයෙක් "කිරිකාරයා" යන්නෙන් හගවන්නේය.

33. ඇර තිබෙන වැසිකිළියකට හෝ බිම මතුපිට වැසිකිළියකට අඩි සියයක් ඇතුළත තිබෙන භූමියක හෝ ඒට නරක ගඳඑන ස්ථානයක් හෝ කිසිම කිරිවෙළඳාම්පළක් නොතැබියයුතුයි. තවද කිරිවෙළඳාම්පලකට අඩි සියයක් ඇතුළත ඇර තිබෙන වැසිකිළියක් හෝ බිම මතුපිට වැසිකිළියක් නොසෑදිය යුතුයි.

34. කිරිවෙළඳාම්පළවල මිදුල් සභාපතිතැනට සතුටුදායකවන අන්දමේ නිසියාකාර සෑහෙන පමණ කානුවලින් යුක්තවිය යුතුයි. තවද කානුවලට වතුරගෑස සේදිය යුතුයි. කිසිම කිරිවෙළඳාම්පළක් අවට භූමියේ අපිරිසිදු වතුර එක්වීතිබෙන්ටඉඩනොදිය යුතුයි.

35. කිරිවෙළඳාම්පළක් ඇතුළේ සහ එහි මිදුල්වලත් තිබෙන කුණුකසල සියල්ලම කිසිම ප්‍රමාදයක් නැතුව ඉවතට දැමිය යුතුයි ගොම දිනපතාම ඉවත්කළ යුතුයි.

36. සෑම කිරිවෙළඳාම්පළවලට පාවිච්චිය පිණිස පිරිසිදුවූ ආරක්ෂාකරනලද වතුර පහසු පමණ දුරින් සපයා තැබිය යුතුයි. මේ ජල ස්ථානය සමීපයෙහි වතුර නෑම හෝ රෙදි සේදීම් නොකළ යුතුයි.

37. කිරිඑළදෙනුන් සහ මීදෙනුන් ලෙඩවලින් තොරවී සිටිය යුතුයි. තවද බෝවෙන රෝගයකින් හෝ වසංගත රෝගයකින් පෙළෙන්නාවූ කෙනෙක් හෝ කිරි වෙළඳාම්පළක් භාරව සිටින යම් කෙනෙක් දැනුවත්ව එවැනි රෝගයකින් ළඟදී පෙළීසිටියාවූ හෝ එවැනි රෝගයකින් පෙළෙනු රෝගාතුරයෙකුට සාත්තුකිරීමෙහි ළඟදී සිටියාවූ කිසිවෙකු කිරි වෙළඳාම්පළ භාරව සිටින එවැනි අය එම කිරි වෙළඳාම්පළේ මෙහෙයකිරීමෙහි යොදනුලැබීමට අවසර නොදිය යුතුයි.

38 කිරි දෙවීමට පෙර දෙනුන්ගේ කිරිබුරුළු සහ තනපුඩුත් සෝදනවාද යනු සියළුම කිරි වෙළඳාම්පළවල් භාරකාරයන් විසින් බැලිය යුතුයි. තවද කිරි දෙවන්නා කිරි දෙවීමට පෙර ඔහුගේ අත් සබන් සහ වතුරෙන් හොඳකොට සෝදගත යුතුයි. ගොමෙන් හෝ මූත්‍රවලින් කිරි අපිරිසිදු නොවීමට සෑම ආකාරයෙන්ම ප්‍රවේසම් ගතයුතුයි.

39. කිරි වෙළෙන්දෙකු හෝ කිරි වෙළඳාම්පළක අයිතිකාරයෙකු විසින් කිරිවලට වතුර හෝ වෙන යම් දියරක් හෝ ද්‍රව්‍යයක් මිශ්‍රකොට කිරි දූෂ්‍යනොකළ යුතුයි. තවද ඔහු විසින් එසේ කරනලද කිරි විකිණීම හෝ විකිණීමට තිබීම හෝ නොකළ යුතුයි.

40. කිරි වෙළඳාම්පළකට අයිතිවූ හෝ ඒවා පාවිච්චිකරනුලබන භාජන බඩු සහ අනිකුත් උපකරණ පවිත්‍රලෙස තැබිය යුතුයි.

41. කිරි අඩංගුවූ පිට අරිනුලබන සියලුම භාජන ඉතා පවිත්‍රලෙස සහ නිසියාකාර වසා පිරිසිදු ද්‍රව්‍යයන්ගෙන් ඇබ නොහොත් පොරොප්ප ගසා තිබිය යුතුයි. තවද ඒ භාජන කිසිල්ල යට තබාගත නොයා යුතුයි. තවද බෝතල කටවල ඇඟිලිගෑසීම නොකළයුතුයි.

42. ගවයින් තබනුලබන මඩු සහ ගෙවල් ලෝකල්බෝඩ් සභාවේ ගාල් සම්බන්ධ නියෝගවලට අනුව සහ ඒට යටත්ව තිබිය යුතුයි

43. කිරි වෙළඳාම්පළකට අවසර පත්‍රයක් ලබාගත් සෑම අයටම කිරි තැබීමට සහ සුදුනම්කිරීම පිණිස එළදෙනුන්ගේ මඩුවලින් ඈත ලෝකල්බෝඩ් සභාවේ සභාපතිතැන විසින් මැනවයි පිළිගන්නා දුර ප්‍රමාණයක සහ ස්ථානයක සාදනලද කිරි කාමරයක් තිබිය යුතුයි. එහි ඔහුගේ වෙළඳාම් සම්බන්ධව පාවිච්චිකරන සියලුම භාජන පවිත්‍රකළාසින්පසු තැබිය යුතුයි. ගෙබිමත් භිත්ති සන්ධිවන ස්ථානයෙහි කවාකාර මුලු ඇතුව සිමෙන්තියෙන් සාදා තිබිය යුතුයි. භිත්ති කපරාරුකර ගලින් හෝ සිනිඳු ලෑලිවලින් හෝ යකඩවලින් සාදා සභාපතිතැන විසින් හෝ සනීපාරක්ෂා කොමසාරිස්තැන විසින් හෝ නියමකරනු ආකාර කලින්කල සුදුහුනු හෝ තීන්ත ගෑම කළයුතුයි. අඩුගණනේ කිරි කාමරයක එකිනෙක ඉදිරිපිට තිබෙන භිත්තිදෙක එළිමහනට යාව තැබිය යුතුයි. දූලි ඇතුළට ඒම වලක්වන පිණිස වද්දවනලද ලෑලිවලින් වහලට සීලින් ගැසිය යුතුයි. එහි අඩුගණනේ එක දොරක් සහ එක ජනේලයක්ද තැබිය යුතුයි. වීදුරු හෝ මහත පියන් රහිත අඩි 3ක් දිග සහ 1ක් පළල ජනේල තබා මැස්සන්ට යා නොහැකි දැල් සවිකළ යුතුයි. ජනේලය ඉදිරිපිටින් දොර තැබිය යුතුයි. තවද දොර කිට්ටුකර වද්දවා මැස්සන් නොයනලෙස දැල්ගසා වසා තැබිය යුතුයි. ගල්ලෑලි හෝ සින්ක්තහඩු හෝ පිළිගන්නාලද දිය කාන්දුනොවෙන වෙනයම් ද්‍රව්‍යයකින් වසනලද මේසයක් කිරි කාමරයේ තැබිය යුතුයි මේ කාමරය කිරි තැබීමට සහ සූදානම්කිරීමටද වෙළඳාම් සම්බන්ධව පාවිච්චිකරන සියලුම භාජන පවිත්‍රකළාසින්පසු එහි තැබීමටද මිස වෙන කිසිම් වැඩකට පාවිච්චි නොකළ යුතුයි.

44. කිරි වෙළඳාම්පලකට අවසරයගත් සෑම අයම ඔහුගෙන් කිරිගන්නා අයගේ නාමලේඛනයක් තැබිය යුතුයි. එය ලෝකල්බෝඩ් සභාවේ සභාපතිතැන විසින් හෝ සනීපාරක්ෂා කොමසාරිස්තැන විසින් හෝ ඔහුගේ උප මූලාදෑනින් විසින් සෑම සුදුසු වේලාවල පරීක්ෂාකරනුලැබීමට අවකාශ ඇතිසේ තැබිය යුතුයි.

45. එක එක කිරි වෙළඳාම්පලට තබාගන්ට අවසරදී තිබෙන එළදෙනුන්ගේ ගණන එම අවසර පත්‍රයේ සඳහන්කර තිබිය යුතුයි.

46 ප්‍රථමයෙන් සභාපතිතැනගෙන් ලබාගන්නාලද අවසරයක් නොමැතිව කිරි වෙළඳාම්පළත් පිහිටි ස්ථානය මාරුකිරීම හෝ අවසරපත්‍රයේ සඳහන්වන ස්ථානයේ හැර වෙන ස්ථානයක කිරිදෙවීම හෝ කිරි වෙළඳාම්පළකට අවසරගත් කිසිම කෙනෙකු විසින් නොකළ යුතුයි.

47. පරීක්ෂක මූලාදෑනින් කිරිපළ බලන්ට ආවිටක ඔහුගේ රිපෝර්තු ලියාතැබීම පිණිස කිරි වෙළඳාම්පලකට අවසර ගත් සෑම අයම ඔහුගේ කිරි කාමරයේ රිපෝර්තු පොතක් තැබිය යුතුයි.

48. ලෝකල්බෝඩ් නගර සීමාතුළ පිහිටියාවූ සෑම කිරි වෙළඳාම්පලම සභාපතිතැන විසින් ලියාපදිංචිකරනු ලැබේ. එක එක ඉල්ලුම්කාරයාට ඔහුගේ නම සහ නොම්මරයත් දරන පත්‍රයක් සභාපතිතැන විසින් දෙනුලැබේ. මේ පත්‍රය බලයලත් මූලාදෑනින් විසින් බලන්ට ඉල්ලුම්කළවිටකදී පෙන්විය යුතුයි.

49. ලෝකල්බෝඩ් සභාවේ සභාපතිතැන හෝ සනීපාරක්‍ෂා කොමිසාරිස්තැන හෝ ඔහුගේ උප මූලාදෑනින් හෝ පළාතේ ප්‍රධාන මූලාදෑනියා හෝ ලෝකල්බෝඩ් සභාවේ සභාපතිතැන විසින් හෝ සනීපාරක්‍ෂා කොමිසාරිස්තැන විසින් නගරයේ සනීපාරක්‍ෂාව සම්බන්ධව සෝදිසිකිරීමට බලය දෙනලද යම් කිසි පරීක්‍ෂකයෙක් ලෝකල්බෝඩ් නගර සීමාතුළ අවසර ලත් කිරි වෙළඳඹපලකින් හෝ කිරි වෙළඳාම්කරන්නාවූ හෝ විකිණීමට තබාසිටින්නාවූ කෙනෙකු හෝ පරීක්‍ෂාකරනුලැබීම පිණිස කිරි ටිකක් ගැණීමට හැමකල්හිම බලය දෙනුලබන්නෝ වෙත්.

50. මෙම අතුරුපණත්වල පිටපතක් සෑම කිරි වෙළඳඹපලේ කිරි කාමරයේ එල්ලා තැබිය යුතුයි.

## E.—ඇඳුම් අපුල්ලා මදින ස්ථාන.

51. කිසියම් කොඩනැගිල්ලක්, මඩුවක්, ඉඩමක්, ළිඳක් හෝ අන්‍ය යම්කිසි අන්දමකින් වතුර සැපයීමකර රක්‍ෂාව වශයෙන් හෝ ජීවිකාව උදෙසා මුදල් සැපයීමට යමෙකුට හෝ යම් අයවලුන්ට කුලියට රෙදි සේදීම හෝ වියලීමට පාවිච්චි කරනුලබන මොනයම් ස්ථානයකින් හෝ එක්කෝ රෙදි තැබීමට ඇපිල්ලීමට හෝ මැදීමට රෙදි මදින්නෙකු විසින් පාවිච්චි කරනුලබන මොනයම් ගොඩනැගිල්ලක් මඩුවක්, හෝ ස්ථානයක නමුත් නොම්මර 56 (5) වගන්තිය යටතේ ඇඳුම් අපුල්ලා මදින ස්ථානය "යන්නෙන් තේරුම්වේ." ඇඳුම් මදින්නාය යන්නෙන් මෙහි ඉහත විස්තරකරනලද යම්කිසි රෙදි ඇපිල්ලීම යනාදියට පාවිච්චිකරනුලබන ස්ථානයක පදිංචිකාරයෙක් හෝ අනුන්ට කුලියට රෙදි සේදීමෙහි, වියලීමෙහි. මැදීමෙහි එකතු කිරීමෙහි හෝ ගොඩනැගීමෙහි නියුක්ත කවරෙක් නමුත් අදහස්කරන්නේය.

52. සභාපතිතැන ඕනෑකලවිටක කිලුටු රෙදි තබාගැනීම පිණිස වෙනම කාමරයක් සෑම අපුල්ලන්නන් විසින් සූදානම්කර තැබිය යුතුය. තවද එකී කාමරය හොඳකාර වාතය ගමන්කිරීමට සලස්වා පිරිසිදුව තබාගත යුතුමත්හැර අවුරුද්දකට දෙවතාවක් බැගින් සුදුහුනු ගෑයුතුයි.

53. වාසයකිරීමට පාවිච්චිකරන කිසිම කාමරයක අපුල්ලන්නා විසින් කිලුටු රෙදි නොතැබිය යුතුයි.

54. මහජනයාගේ සනීපයේ ප්‍රයෝජනය සහ යහපත සඳහා සභාපතිතැන උවමනායයි සිතන්නේනම් රෙදි ඇපිල්ලීම පිණිස විශේෂ ස්ථාන වෙන්කර තබනවා ඇත. එවැනි ස්ථාන දැන්වීම්ලෑල්ලකින් පෙන්නුම්කරනුලැබේ.

55. අපුල්ලන කෙනෙකුට හෝ ඔහුගේ ගෙයි වැසියෙකුට හෝ යම් කිසි වසංගත නොහොත් බෝවෙන රෝගයක් වැලඳුනීනම් පැය 24ක් ඇතුළතදී ඒබව ලෝකල්බෝඩ් සභාවේ සභාපතිතැනට පරීක්‍ෂකතැන මගින් හෝ පොලිස් මූලාදෑනියා මගින් හෝ දැනුම්දිය යුතුයි.

56. යම් අපුල්ලන කෙනෙකුට හෝ ඔහුගේ ගෙදර වැසියෙකුට හෝ යම්කිසි වසංගත නොහොත් බෝවෙන රෝගයක් වැළඳුනකල අපුල්ලන ස්ථානයෙහි වැඩ එකෙනෙහිම නැවැත්විය යුතුයි. එබඳු රෝගයක් පවත්ගත් පසුත් පවත්නා තුරුත් සභාපතිතැනගේ විශේෂ අවසරයකින් මිස අපුල්ලන ස්ථානයකට ඇඳුම් ගෙනඒම හෝ එයින් පිටත ගෙනයෑම හෝ නොකළ යුතුයි.

57. යම් ගෙයක වැසියෙක් බෝවෙන රෝගයකින් පෙළෙනබව විශ්වාසකිරීමට කාරණ තිබේනම් ලෝකල්බෝඩ් සභාවේ සභාපතිතැනගෙන් හෝ සනීපාරක්‍ෂා කොමිසාරිස්තැනගෙන් අවසරය නැතුව එවැනි ගෙයකින් කිලුටු රෙදි ගැනීම කිසිම අපුල්ලන්නෙකු විසින් නොකල යුතුයි.

58. ලෝකල්බෝඩ් සභාවේ සභාපතිතැන විසින් හෝ සනීපාරක්‍ෂා කොමිසාරිස්තැන විසින් හෝ ඔහුගේ උප මූලාදෑනියෙකු විසින් ඕනෑකලවිට සෑම අපුල්ලන්නාම ඔහුගේ රෙදි සෝදන අයවලුන්ගේ නාමලේඛනයක් දියයුතුයි.

## F—පොදු නවාතැන් ගෙවල්.

59. 56 (5) යන වගන්තිය යටතේ තිබෙන අතුරුපණත් උදෙසා පොදු නවාතැන් ගෙවල් යන්නෙන් එකම පවුලේ අයවලුන් නොවන හතරදෙනෙක් හෝ වැඩිගණනක් කුලියට නවත්වාගන්නා ගෙයක් හෝ ගෙයකින් කොටසක් හඟවන්නේය.

60. පොදු නවාතැන් ගෙයක් සම්ලෙස සෑදූ හොඳකාර අලුත්වැඩියාකරමින් තබාගත යුතුයි. තවද නිදාගන්න කාමර සභාපතිතැන සතුටුවෙන අන්දමට හොඳකාර වාතය ගමන්කිරීමට ඉඩඇතුවද එළියඇතුවද තැබිය යුතුයි. තවද එකී නිකාති අවුරුද්දකට තුන්වරක් බැගින් සුදුහුනු ගෑයුතුයි.

61. පොදු නවාතැන් ගෙයක් භාරකාරයා නිතරම ඒ ස්ථානය පවිත්‍රලෙස සහ සනීපාරක්‍ෂ අන්දමටත් තබාගත යුතුයි. කුණුකසළ සහ අන්තරායසහිත ද්‍රව්‍යයන් සියල්ලම එම ස්ථානයෙන් ඉවත්කිරීම කරවිය යුතුයි.

62. පොදු නවාතැන්පලක සිටින කිසිමෙකු වසංගත නොහොත් බෝවෙන රෝගයකින් ලෙඩවූවිට නවාතැන්පල භාරකාරයා විසින් ලෝකල්බෝඩ් සභාවේ පරීක්‍ෂකතැන මගින් හෝ පොලිස් මූලාදෑනියා මගින් හෝ ඒබව නීති බලයලත් මූලාදෑනිතැනට වහාම දැන්විය යුතුයි. තවද නවාතැන්පල හැරයෑම සඳහා හෝ ඇඳ ඇතිරිලිවලද ඇඳුම්වලද අන්‍ය ද්‍රව්‍යවලද රෝග බෝවීමට හේතුවූදේ විනාශකිරීම් සඳහාද ගෙයට දුම්ඇල්ලීම එකී රෝග බෝවීමට හේතුවූදේ නැතිකිරීම සහ සුදුහුනු ගෑම සඳහාද නීතිබලයලත් මූලාදෑනියා විසින් කරනුලබනු නියෝගවලට ඔහු කීකරුවිය යුතුයි.

63. ගෙයි වාසයකරන අයට සෑහෙන පමණ වැසිකිළි තබාගැනීම සහ ඒවා සනීපාරක්‍ෂක අන්දමට තැබීම ගැනත් පොදු නවාතැන්පලක භාරකාරයා වගකිය යුතුයි.

64. යම්කිසි පොදු නවාතැන්පලක නැවතීමට ඉඩදියහැකි අයවලුන්ගේ වැඩිම ගණන නියමකිරීමට ලෝකල්බෝඩ් සභාවේ සභාපතිතැනට මෙයින් බලයදෙනු ලැබේ. තවද එබඳු ගණන අවසරපත්‍රයේ සඳහන්කරණු ලැබේ. එබඳු ගණන වැඩිවීමට ඉඩහරින යම්කිසි පොදු නවාතැන්පලක භාරකාරයෙක් නීතිවිරෝධී දෙයක් කිරීමේ වරදකාරයෙකු වෙනවාඇත. මේ අතුරුපණතේ අදහස පිණිස වයස අවුරුදු දොළහෙන් පහත ළමයින් දෙදෙනෙකු එක අයෙකුමෙන් ගණන්ගනු ලැබේ.

65. ලෝකල්බෝඩ් සභාවේ සභාපතිතැන විසින් හෝ සනීපාරක්‍ෂා කොමිසාරිස්තැන විසින් හෝ ඔහුගේ උප මූලාදෑනින් විසින් හෝ පළාතේ ප්‍රධාන මූලාදෑනිතැන විසින් හෝ එකී පොදු නවාතැන්පලක් පිහිටා තිබෙන සනීපාරක්‍ෂක නගරයක සනීපය සම්බන්ධ පරීක්‍ෂනයන් සඳහා ලෝකල්බෝඩ් සභාවේ සභාපතිතැන විසින් හෝ සනීපාරක්‍ෂා කොමිසාරිස්තැන විසින් පත්කරනලද සනීපාරක්‍ෂක පරීක්‍ෂකයෙකු විසින් සෑම වේලාවලම සෝදිසිකරනුලැබීමට අවකාශ ඇතිඅකාර පොදුනවාතැන්පළ තැබියයුතුයි.

## G.—සෝදන ස්ථාන.

66. කරනලද යෝජනාවකින් යෝග්‍යයයි සිතන අකාර කලින්කලට අශ්වයන්, ගවයන් රෙදි සහ පැදුරු සේදීම පිණිස ස්ථාන වෙන්කර තැබීමට සහ ඒවා පාවිච්චිකරන වේලාවල් නියමකිරීමටද සභාවට බලය තිබේ

67. එආකාර වෙන්කරනු ලබන ස්ථානවල ලේඛනයක් ඉංග්‍රීසියෙන්. සිංහලෙන් සහ දෙමළෙන්ද ආණ්ඩුවේ ගැසැට් පත්‍රයේ ප්‍රසිද්ධකරනු ලැබේ තවද එය නගර සීමාතුළ අණබෙර ගැසීමෙන්ද ප්‍රකාශකරනු ලැබේ. තවදයටකියනලද භාෂා තුනෙන්ම ලේඛනයේ පිටපත් කන්තෝරුවේ අලවා තැබිය යුතුයි.

68. සභාව විසින් මෙසේ වෙන්කරනුලබන ස්ථානවල හැර වෙන කිසියම් ප්‍රසිද්ධ නාන ස්ථානයක අශ්වයන්, ගවයන්, රෙදි හෝ පැදුරු සේදීම කිසිවෙකු විසින් නොකළයුතුයි.

69. අනුරාධපුරේ රෙදි සෝදන පොකුණේ කුලියට රෙදි සෝදන සෑම අයවලුන්ගේ නම් ලෝකල්බෝඩ් සභාවේ සභාපතිතැන ලවා ලියාපදිංචිකරවාගත යුතුයි.

70. වසංගත නොහොත් බෝවන රෝගයකින් පෙළෙන්නාවූ අයගෙන් හෝ සරක් රෙදි සෝදන ස්ථානවල සේදීම නොකළයුතුයි. තවද බෝවෙන හෝ වසංගත රෝගයක් වැළඳී සිටින්නාවූ හෝ (ඉහත සඳහන් අන්දමට රෙදි සෝදන ස්ථානයක් හැටියට වෙන්කරනලද ස්ථානයක් භාරව සිටින කෙනෙක් දැනුවත්ව) ළඟදී බෝවෙන හෝ වසංගත රෝගයක් වැළඳී සිටියාවූ හෝ ඒ අන්දමේ රෝගයක් වැළඳීසිටින කෙනෙකුට සාත්තුකළාවූ කිසිකෙනෙකුට රෙදි සෝදන ස්ථාන භාර කාරයෙකු විසින් රෙදි හෝ වෙනදෙයක් සේදීමට ඉඩ නොදිය යුතුය.

## H.—ප්‍රසිද්ධ නාන ස්ථාන.

71. මේ නියෝගවල කාරණයන් සඳහා ප්‍රසිද්ධ නාන ස්ථාන යන්නෙන්, 72වෙනි නියෝගය යටතේ ලෝකල්බෝඩ් සභාවේ අනුව පිට නෑම පිණිස වෙන්කරනලද යම් ස්ථානයක් අදහස්කරන්නේය.

72. ලෝකල්බෝඩ් සභාවේ බලය පවතින යම් ප්‍රසිද්ධ ස්ථානයක් හෝ එයින් කොටසක් ප්‍රසිද්ධ නාන ස්ථානයක් හැටියට පාවිච්චිකරනුලැබීම පිණිස යෝජනාවකින් වෙන්කර තබන්ට සභාවට පුළුවන. තවද එවැනි ප්‍රසිද්ධ නාන ස්ථානයක මායිම් හා සම්බන්ධවන තැන් විස්තරකිරීමටද සභාවට පුළුවන.

73. ප්‍රසිද්ධ නාන ස්ථානයකට වතුර ලිඳකින් සපයනුලබනවිට කිසිවෙකු විසින් සරක් හෝ වෙන සතුන් හෝ පැදුරු හෝ වෙනයම් දෙයක් හෝ ඔහු ඇඳසිටින වස්ත්‍ර හැර වෙන රෙදි හෝ සේදීමට එකී ළිඳ පාවිච්චි නොකළ යුතුයි. තවද එකී ඇඳසිටින වස්ත්‍ර ගලකගැසීම හෝ වෙන විධියකින් ගැසීමක් කරනවිට එයින් විසිවෙන දිය ලිඳට නොවැටෙන තරම් දුරින් සිට එසේ කළයුතුයි.

74. කිසිම ප්‍රසිද්ධ නාන ස්ථානයක් අසල පැහැරීමෙන් හෝ මූත්‍රාකිරීමෙන් කිසිවෙකු විසින් දූෂ්‍ය ක්‍රියාවන් නොකළ යුතුයි.

## I.—අනතුරුය සහිත සහ අප්‍රිය (අශෝභන අප්‍රසන්න) වෙළඳාම්.

75. මේ නියෝගවල කාරණ ගැණ අනතුරුය සහිත අප්‍රසන්න වෙළඳාම් යන්නෙන් මෙහි පහත දක්වන ඒවායින් යම්කිසි එකක් හඟවන්නේය හෙවත් අනතුරීන වන්නේය. යන්ත්‍ර මාර්ගයෙන් සාදන පෝර ගබඩාකරතැබීම හෝ සෑදීම, හෝ පෝරසෑදීමට උවමනා යම් ද්‍රව්‍යයක් ගබඩාකරතැබීම ලේ හෝ හරකමස් තැම්බීම, ලේ හෝ කුණුමස් වේලීම, සම් පදම්කිරීම, සතුන්ගේ තෙලඋණුකිරීම සතුන්ගේ තෙල්ගැනීම, සබන්සෑදීම, පොල්ලෙලි පෙපෙවීම, කොහු සායම්කිරීම, පොල්තෙල් කම්හලය (යන්ත්‍ර සූත්‍ර පාවිච්චිකරන තැන්වල) කොහුකම්හලය කිරීම සහ එය රැස්කර තැබීම, සම් ඇටකටු සහ සාදනු පෝර ගබඩාකර තැබීම, බ ' ප්‍රමාණයෙන් හොණ්ඩර 5කට වඩා බරවූ උම්බලකඩ රැස්කර තිබීම, සිසිල්බීම සෑදීම, මිනිරන් රැස්කර තැබීම, හෝ ශුද්ධකිරීම.

76. ලෝකල්බෝඩ් සභාවේ සභාපතිතැනගෙන් අවසර පත්‍රයක් නොමැතිව කිසිම ලෝකල්බෝඩ් නගර සීමාතුළ පිහිටි යම් ඉඩමක හෝ භූමිභාගයක අයිතිකාරයා හෝ පදිංචිකාරයා එම ඉඩමේ හෝ භූමිභාගයේ කිසිම අනතුරුය සහිත හෝ අප්‍රිය අශෝභන වෙළඳාමක් හෝ හස්තකම්හලයක් කිරීමට හෝ වෙළඳාම්කිරීමට ඉඩහැර සිටීම නොකළ යුතුයි. මෙම පණත්වලින් යම් එකකට හෝ දැනට පවත්නා ලෝකල්බෝඩ් සභාවේ වෙන පණතකට අනුව ක්‍රියාකිරීම අනපසුකරන යම්කිසි කෙනෙකුට එම අවසරපත්‍රයදීම ප්‍රතික්ෂේපකිරීමට ලෝකල්බෝඩ් සභාවේ සභාපතිතැනට වැඩිදුරටත් බලය දෙනලැබේ.

එවැනි අවසරපත්‍රය කාරක මන්ත්‍රීසභාව ඇතුළුව ආණ්ඩුකාර උතුමාණන්වහන්සේගේ කැමැත්ත ඇතිව කලින්කල ලෝකල්බෝඩ් භාව සවිසින් නියමකරනුලබන ගාස්තු ගෙවීමට යටත්ව දිය යුතුයි.

77. මෙම අතුරුපණත්වලින් යම් එකක් කඩකිරීමගැන යමෙක් දෙවතාවක් හෝ ඊට වැඩි වාර ගණනක් යම් උසාවියක් විසින් දඬුවම්කරනු ලබන්නේනම් දෙවෙනි හෝ ඊට පසු වන්නාවූ නඩුව ලියාසිටින උසාවිය විසින් මේ පරිච්ඡේදය යටතේ ලෝකල්බෝඩ් සභාවේ සභාපතිතැන විසින් එම අයට නිකුත්කරනලද අවසරපත්‍රය අවලංගුකිරීමට බලය තිබේ. උසාවිය විසින් අවසරපත්‍රයක් එසේ අවලංගුකරනුලැබූ කල්හි එම අයට අලුත් අවසරපත්‍රයක් නිකුත්කිරීම සභාපතිතැනගේ කැමැත්තේ ප්‍රකාර ප්‍රතික්ෂේපකිරීමට එතුමාට බලය දෙනුලැබේ.

78 යට කියනලද වෙළඳාම්වලින්, කම්හලවලින්, හස්තකම්හලවලින් යම්කිසි එකක් කරගෙනයෑම පිණිස උවමනා කරන්නාවූ සියලුම ද්‍රව්‍යයන් දූෂ්‍ය වාතය හෝ අප්‍රිය වැළඳෙන ප්‍රකාර ගබඩාකර තැබිය යුතුයි. ප්‍රසිද්ධ පාරක් දිගේ ගෙන යෑමට තිබෙන අප්‍රිය ගඳගහන සියලුම ද්‍රව්‍යයන් දිය බීනොගන්නාවූ වසනලද භාජනවල හෝ එබඳු වෙනයම් අප්‍රිය වළක්වන්නාවූ සභාපතිතැන විසින් නියමකරන වෙන ප්‍රකාරයකින් ගෙනයෑම කළයුතුයි.

79. යම්කිසි ක්‍රියා ක්‍රමයකදී හෝ හස්තකම්හලයකදී පිටවෙන අප්‍රිය වාෂ්පය නොහොත් ධූමයන් උපද්‍රව රහිත කර වීමට උවමනා බලගතු උපක්‍රමයන් යෙදිය යුතුයි. එවැනි වාෂ්පයන් හෝ ධූමයන් එක්කෝ අනතුරුය සහිතවූ හෝ වේදනා සහිතවූ දෙයක් නොවැතිව විසිරයෑමට ඉඩඇතිවනලෙස යම් විධියකින් සහ උස ප්‍රමාණයකින් පිට අවකාශයට යැවීම කළ යුතුයි. එක්කෝ ඒවා කෙලින්ම ගින්නක් මැදින් හෝ වාෂ්පය සනකරණ යන්ත්‍රයකට ගැටිය යුතුයි. නොබැගිලිවලට අයත් භූමිභාගය සෑහෙන පමණ කානුවලින් යුක්තකළ යුතුයි. තවද කාණු යහපත් පිළිවෙළක තබා දිනපතා සේදිය යුතුයි.

80. ගෙබිම් නිසියාකාර අලුත්වැඩියාකර තබාගතයුතුවා පමණක් නොව ඒවා දිනපතා පවිත්‍රකළ යුතුයි. තවද සභාපතිතැන විසින් අණකරනුලැබූකල්හි එසේ දුන් අණපරිදි සිදුරුකළ නොහැකි ද්‍රව්‍යවලින් ඒවා සෑදිය යුතුයි.

81. කුණු උරාගැනීම වළක්වනසේ භිත්ති යහපත්ලෙස තබාගත යුතුයි. තවද අවුරුද්දකට දෙවරක් හෝ ලෝකල් බෝඩ් සභාවේ සභාපතිතැන විසින් හෝ සනීපාරක්ෂා කොමසාරිස්තැන විසින් එසේ නියමකරනු ලැබේනම් ඊට වැඩි වාර ගණනක් ඒවායේ සුදුහුනු ගෑයුතුයි.

82. උපකරණ සහ භාජන ඇතුළුව සියලුම යන්ත්‍ර පවිත්‍රලෙස තැබිය යුතුයි. තවද පූර්වෝක්ත අවස්ථාවන්හි ඒවා දිනපතා සේදියයුතුයි. සියලුම අහකදමන දේවල්ද අතුගෑමියයුතු දේවල්ද සුරුඳමින දේවල් සහ අගකයන දේවල්ද සායම් සෑදීමෙන් ඉතිරිවන දේවල්ද එම ස්ථානයේදීම වැඩිදුරටත් වෙළඳාම් පිණිස කටයුත්තකට වහාම නොගන්නේනම් වසනලද භාජනයන්හි දමා දවස්පතා ස්ථානයෙන් ඉවත්කළ යුතුයි.

83. සම් හෝ වෙනයම් ද්‍රව්‍යයන් සේදීමට හෝ පෙන්වීමට පාවිච්චිකරනු ලබන වතුර ටැන්කිවලින් නගින ගඳ වැළැක්වීමට උවමනා ප්‍රමාණ වාර ගණනක් ඒවායේ වතුර අහක්කර පවිත්‍රකළ යුතුයි.

84. යම්කිසි අප්‍රිය වෙළඳාමක් හෝ හස්තකම්හලයක් කරන්නාවූ කෙනෙක් හෝ එවැනි වෙළඳාමක් හෝ හස්තකම්හලයක් කරනු ලබන්නාවූ ඉඩමක හෝ ස්ථානයක අයිතිකාරයා හෝ පදිංචිකාරයා දූෂ්‍යවූ ගඳගහන්නාවූ අප්‍රිය උපදවන වතුර හෝ වෙනයම් දියාරු ද්‍රව්‍යයක් දැමීමෙන් හෝ දමන්ට ඉඩඇරීමෙන්ද යම් කිසි අප්‍රිය උපදවන ද්‍රව්‍යයක් විසිකිරීමෙන් හෝ සෝදන්ට ඉඩඇරීමෙන්ද යම් ගඟක් දොළක් කැපූඇළක්, ඔබයක්, ලිඳක්, වැවක් හෝ බැහැර තිබෙන ජලාශයක අපවිත්‍ර නොකළයුතුවත් ඇර වෙන කිසිම අන්දමකින් එවැනි ගඟක්, දොළක්, ඇළක්, ඔබයක්, ලිඳක්, වැවක් හෝ ඇර තිබෙන ජලාශයක් අපිරිසිදුකිරීම හෝ දූෂ්‍යකිරීම නොකළ යුතුය

85. යට කියනලද සියලුම වෙළඳාම්කාරණ ස්ථාන ලෝකල්බෝඩ් සභාවේ සභාපතිතැන විසින් හෝ සභාපතිතැනගෙන් නිසිලෙස බලයලත් යමෙකු විසින් සෑහෙන සියළුම වේලාවලදී පරීක්ෂාකරනු ලැබීමට අවකාශ ඇතිසේ තැබියයුතුයි.

86. ගඩොල් සෑදීමට හෝ උළු සෑදීමට හෝ ගොඩනැගිලිකිරීමට හෝ වෙනයම් කාරණයකට මැටි, පස්, ගල්, බොරළු, කබුක්ගල් හෝ වෙනයම්, ද්‍රව්‍යයක් කපාගන්නාවූ ඉඩමක අයිතිකාරයා හෝ පදිංචිකාරයා එහි නිසිලෙස වතුර බැසයාමට කානුතැබීම සහ වතුර නැවතී පල්නොවෙන අකාර එම වළවල් සහ අගල් පසුව පුරවාදැමීම ගැනත් වගකියයුතුවේ.

## J.—සිසිල්බීම වර්ග සෑදීම.

87. ලෝකල්බෝඩ් සභාවට අයත් මායිම්තුළ කිසිවෙකු විසින් වෙළඳාම පිණිස මාහැයකට ප්‍රථම ලියවිල්ලකින් සභාපතිතුමාට දැනුම්නොදී එයරේටඩ් වෝටර්ස් නමැති සිසිල්බීම සෑදීමට ආරම්භ නොකළයුතුයි.

88. යම් ගාලකට, පට්ටියකට, හෝ දිවා රෑ දෙකෙහි සතුන් නවත්වන පිණිස පාවිච්චිකරන ස්ථානයකට හෝ යම් වැසිකිළියකට හෝ අශූචිවළකට අඩි 150කට අඩු දුර ප්‍රමාණයක් ඇතුළත සිසිල්බීම සාදන කර්මාන්ත ශාලාවක් තබන්ට බැරිය. එම කර්මාන්තශාලාවේ කිසියම් කොටසක් පදිංචි ගෙයක් මෙන් පාවිච්චි නොකළයුතුයි.

89. සිසිල්බීම් සෑදීමට පාවිච්චිකරණලද සියලුම ස්ථාන හොඳකාර එළිය ඇතිවන අන්දමටද වාතය ඇතුල්වන අන්දමටද තිබෙන්ට ඕනෑය. බිමට සිමෙන්ති දමා කිසිවිට ද්‍රව්‍ය පිටකිරීම පිණිස හොඳකාර තනනලද කානු තිබෙන්ට ඕනෑවා සහ කුණුකසල සහ දූවිලි නැතුව පිරිසිදුකොටසද තිබෙන්ට ඕනෑය. සිසිල්බීම්වගී සෑදීම මැස්සන්ට ඇතුල්විය නොහැකිසේ සාදනලද වෙනම කාමරයක කළයුතුයි. සිසිල්බීම්වගී සෑදීමට පාවිච්චිකරනුලබන සියලුම බෙහෙත්වගී සහ අන්‍ය ද්‍රව්‍යයන්ද හොඳ ඒවා වියයුතුයි. පාවිච්චිකරණුලබන සියලුම වලන් භාජන සහ යන්ත්‍රාදියද ඉතා සැලකිල්ලෙන් පිරිසිදුව තබාගතයුතුයි.

90. සිසිල්බීම් සෑදීම පිණිස ගන්නා වතුර අපිරිසිදුවිය නොහැකි අන්දමට හොඳට ආරක්ෂාකරනලද සහ ලෝකල්බෝඩ් සභාවේ සභාපතිතැන විසින් යෝග්‍යයයි පිළිගනුලැබූවාවූද ස්ථානයකින් ගතයුතුයි. එම වතුර කර්මාන්තශාලාවට ගෙන ඒමේදී දූෂ්‍ය නොවන අන්දමට ගෙනයිය යුතුයි. කර්මාන්ත ශාලාවෙහි තරියාකාර සෑදූවාවූද යන්ත්‍රය හා සම්බන්ධවූද, ටැංකිවල නොහොත් පීල්ලවල ඒ වතුර රැස්කොට තැබිය යුතුයි.

91. සිසිල්බීම සෑදීමට ගන්නා වතුර ලෝකල්බෝඩ් සභාවේ සභාපතිතැන විසින් ඒත්තුගනුලැබූවාවූද යන්ත්‍රයට සම්බන්ධ වතුර පෙරෙන ජිවල් නොහොත් වෙන වගීයක් පිල්ටරයකින් පෙරෙන්ට හැරිය යුතුයි. තවද ඒවා කර්මාන්තෝපකරණවලට සම්බන්ධකොට තිබිය යුතුයි. එහෙත් පොදුජනයාට වතුර දෙන යෝග්‍යයයි පිළිගත් ස්ථානයක බීම සෑදීමට වතුර ගන්නේනම් එසේ ගනුලබන වතුර මේ අතුරුපණතට යටත් නොකිරීමට සභාපතිතැනට බලය තිබේ.

91a. ලෝකල්බෝඩ් සීමාවතුළ සාදනලද හෝ ලෝකල්බෝඩ් සීමාවතුළට පිටතින් ගෙනෙනලද හෝ යම්කිසි සිසිල්බීම වගීයක් මනුෂ්‍ය ආහාරයට නොසෑහෙන තරම් නරකයයි කියා ලෝකල්බෝඩ් සභාවේ පරීක්ෂකතැනට ඒත්තුගියවිටක එවැනි බීම තහනමට සහ පොලිස් මැජිස්ත්‍රාත්තුමා ඉදිරිපිට දක්වාසිටින්ට ඔහුට පුළුවන. එවැනි පොලිස් මැජිස්ත්‍රාත් තැනට එසේ දක්වා සිටින බීම මනුෂ්‍ය ආහාරයට නුසුදුසුයයි කියා වැටහුණොත් ඒවා විනාශකරලීමට අණකළහැක. මනුෂ්‍යයාගේ පරිභරණයට නුසුදුසුයයි කියා උසාවියට ඒත්තුගන පරිදි යම් සිසිල්බීම වගීයක් සාදන යම් අයෙක් ඇත්නම් ඔහු වරදක්කිරීම ගැන වැරදිකාරයෙක් වේ.

92. සිසිල්බීම පුරවනුලබන සියලුම බෝතල පෙරපු වතුරෙන් සේදියයුතුවත් ඇර ඉතාමත් පිරිසිදුව තිබෙන්ට ඕනෑය.

93. සිසිල්බීම පුරවනලද සියලුම බෝතලවල ඒ ඒ වගීයේ නමද, සාදන ස්ථානයද, එය සාදනලද කර්මාන්තශාලාව අයිතිකාරයාගේ හෝ සමාගමේ නමද, ඊට ලෝකල්බෝඩ් සභාවේ සභාපතිතැන විසින් දෙනලද නොම්මරයද සඳහන් "ලේබල්" නම් පත්‍රයක් ඇලිය යුතුයි.

94. අවුරුදු දොළහෙන් බාලවූ කිසිවෙක්, බෝවෙන රෝගයකින් හෝ කුෂ්ට රෝගයකින් පෙළෙන කිසිවෙක්ද, සිසිල්බීම සාදන කර්මාන්තශාලාවක වැඩක යොදන්ට යුතු නැත.

95. සිසිල්බීම බෝතලවල පුරවන වැඩේ යෙදීසිටින සියලුමදෙනාම ඒ වේලාවේදී සියුම් සිදුරු ඇති කම්බිවලින් සාදනලද මුහුණුවැසුමක්ද හම්වලින් සාදනලද අත්මේස්ද ඇඳ සිටිය යුතුයි.

96. සිසිල්බීම සෑදීමට වතුරගන්නා ළිං එම වැඩේට පමණක් වෙන්කර තැබිය යුතුයි. එහි නෑම තහනම්ය.

---

"වර්ෂ 1898වේ ලෝකල්බෝඩ් ආඥාපනත."

කාරක මන්ත්‍රසභාගත ගරුතර ආණ්ඩුකාර උතුමාණන්වහන්සේගේ අනුදැනීම ඇතුව තිරිකුණාමලේ ලෝකල්බෝඩ් සභාව විසින් වර්ෂ 1914දී අංක 29 දරන ලෝකල්බෝඩ්සභා (අමුතුකිරීමේ) ආඥාපනතින් අමුතුකරනලද 'වර්ෂ 1898වේ ලෝකල්බෝඩ් සභා පිළිබඳ ආඥාපනතේ 29A වන වගන්තිය යටතේ පහත දක්වන කාරණ සඳහා යම් ස්ථානයක් යෙදීම පිණිස දෙන අවසරපත්‍රවලට අයකරන්නට නියමකරගන්නාලද ගෙවිලි.

ලේඛනය.

| | අවුරුදුපතා ගණන. රු. ශ. |
|---|---|
| භෝජනශාලා | 6 00 |
| තේ සහ කෝපිකඩ | 3 00 |
| එළදෙනුන් 3න් දෙනෙක් හෝ ඊට අඩුවෙන් සිටින කිරිපට්ටියක් | 3 00 |
| එළදෙනුන් 3න් දෙනෙකුට වැඩිනම් | 6 00 |
| රෙදි අපුල්ලන ස්ථාන | 3 00 |
| පොදු නවාතැන් පළවල් | 6 00 |
| පෝර සාදන කර්මාන්ත ශාලාවල් | 100 00 |
| ඇල් හෝ මස්වලින් අපකාරව නොවුනා කැබලි තැම්බීම හෝ වේලීම | 100 00 |
| පාන් ගෙවල් | 25 00 |
| හම් සදම්කරන ස්ථාන | 20 00 |
| සතුන්ගේ තෙල් උනුකිරීම හෝ ගැනීම | 50 00 |
| සබන් සෑදීම | 50 00 |
| කොහු සාලම් පෙවීම | 2 50 |
| ගෝන්ඩර 5කට වැඩිව උම්ලකඩ ගබඩාකිරීම | 5 00 |
| හම්, ඇට, අතින් සාදන පෝර හෝ අතින් සාදන පෝර සෑදීම පිණිස ගන්නා ද්‍රව්‍යයන් ප්‍රමාණයෙන් එක ගෝනියකට වඩා ගබඩාකිරීම | 10 00 |
| කළුගල් හෝ කබුක්ගල් වළවල් | 50 00 |
| ගඩොල් හෝ උළු කර්මාන්තශාලා | 20 00 |
| හුනු පෝරනු | 20 00 |
| සිසිල්බීම සාදන කර්මාන්තශාලා | 100 00 |
| මාළු ජාඩිදමන ස්ථාන | 100 00 |

දැනගත යුත්තේ:—භෝජනශාලා තේ හෝ කෝපිකඩ, සාමාන්‍ය නවාතැන් පළවල්, පාන්ගෙවල් යන මේවාට ගෙවන ගාස්තු අවුරුදු බාගයකට වතාවක් බැගින් කලින් ගෙවන්ට පුළුවන.

උතුමාණන්වහන්සේගේ අණපරිද්දෙන්,
ඊ. බී. ඇලෙක්සැන්ඩර්.
වැඩබලන මහලේකම්තුමාරීස් වම්ය.

වර්ෂ 1925ක්වූ මැයි මස 11වෙනි දින කොළඹ
මහලේකම්තුමාරීස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

## 1898වේ ලෝකල්බෝඩ් (නාගරික) සභා ආඥාපණතයි.

වර්ෂ 1916යේ අංක 27 දරණ ආඥාපණතෙන් හා වර්ෂ 1921යේ අංක 25 දරණ ආඥාපණතෙන්ද අලුත්වැඩියාකරන ලදුව 1898වේ ලෝකල්බෝඩ් ආඥාපණතේ 56වෙනි වගන්තිය යටතේ බණ්ඩාරවෙල ලෝකල්බෝඩ් සභාව විසින් පණවන ලදින් කාරක මන්ත්‍රීසභාවේ අනුශාසනාව ඇතුව ආණ්ඩුකාර උතුමාණන්වහන්සේ විසින් ස්ථිරකරනලද උපනීති.

උතුමාණන්වහන්සේගේ අණපරිදි,

වර්ෂ 1925ක්වූ මැයි මස 27වෙනි දින කොළඹ මහලේකම්තැනගේ කන්තෝරුවේදීය.

ඊ. බී. ඇලැක්සැන්ඩර්,
වැඩබලන මහලේකම්ට වෙනුවට.

### උපනීති.

1. බණ්ඩාරවෙල ලෝකල්බෝඩ් සභාවේ සීමාවතුළ එකී සභාවේ ප්‍රධානතැනගෙන් අවුරුදු පතා ලබාගතයුතු අවසර පත්‍රයක් නොමැතිව කිසිවකු විසින් කිසියම් කිරිපට්ටියක්, පෝර සාදන ස්ථානයක්, ලේ හෝ මස්රොඩු උණුකරන වේලන ස්ථානයක්, සම්පදන්කරනතැනක්, පාන්පුළුස්සනතැනක්, හම්, කටු, සාදනලද පෝර හෝ පෝර සෑදීමට ගන්නා ද්‍රව්‍ය එක ගොඩියකට වඩා තබන ස්ථානයක් ගඩොල් හෝ උළු සාදන ස්ථානයක්, හුණු පුළුස්සන පෝරනුවක්, සිසිල්බීම සාදන ස්ථානයක් තබාගතයුතු නොවේ, තවද එකී ස්ථානවල පිළිවෙළ හා හැසිරීම සලස්වන ව්‍යවස්ථාවලින් යමක් අනුව ක්‍රියා නොකරන යමෙකුට එබඳු අවසර පත්‍රය නොදී හරින්නට සභාපතිතැනට මෙයින් බලය දෙනුලැබේ. අවසරපත්‍රය දෙන ලද්දේ යම් අවුරුද්දක් ගැනද ඒ අවුරුද්දේ දෙසැම්බර් මාසේ 31වෙනි දින වනතුරු හෝ එබඳු අවසරපත්‍රය අවලංගුකරන තුරු එය බලය ඇතුව පැවතේ.

තවද එබඳු අවසරපත්‍රය මන්ත්‍රීසභාගත ආණ්ඩුකාර උතුමාණන්වහන්සේගේ අනුදැන්ම ඇතුව ලෝකල්බෝඩ් සභාව විසින් කලින්කල නියමකරගන්නා ගෙවිලිවලට යටහත්වේ.

2. එකී ස්ථාන හසුරුවාගැනීම පිණිස සම්පාදිත ව්‍යවස්ථාවලින් යමක් කඩකිරීම ගැන යම් නඩුසභාවකින් දෙවරක් හෝ ඉන්වැඩියෙන් වරදකාරයා කරනුලැබූ යමෙක් ඇද්ද එබඳු අයට ලෝකල්බෝඩ් සභාවේ ප්‍රධානතැන විසින් මෙම පරිච්ඡේදය යටතේ දෙනලද අවසරපත්‍රය අවලංගුකරන්නට එසේ දෙවෙනි හෝ ඊටපසු වාරයක වැරදිකාරයා බව සටහන්කර ගන්නා නඩු සභාවට නීතිය අනුව පුළුවන. නඩු සභාවකින් අවසරපත්‍රයක් එසේ අවලංගුකළතැන එබඳු අයට නැවත අවසරපත්‍රයක් ලෝකල්බෝඩ්සභාවේ සභාපතිතැනට අභිමතසේ නොදී හරින්නට ඔහුට බලය තබනලදී. එහෙත් පොදු සභාවකින් පිහිටුවනලද හෝ එබඳු සභාවක් කෙරෙහි පැවරී තිබෙන වෙළඳඅම්පලවල තිබෙන කඩපිළවල් ගැන මෙම ව්‍යවස්ථා නොයෙදේ.

### අනතුරය සහිතවූ හා අප්‍රියකරවූ රක්ෂාවල්.

3. මෙම ව්‍යවස්ථාව පිළිබඳව අනතුරය සහිතවූ සහ අප්‍රියකරවූ රක්ෂාවල් යන්නට මෙහි පහත දක්වන දේවලින් කොයියම් එකක්වුවත් ඇතුළත්වේ එනම්, රටපෝර සෑදීම හා අඟුරුතැබීම, ලේ හෝ මස්රොඩු උණුකිරීම හා වේලීම හම් පදම්කිරීම, සතුන්ගේ තෙල් උණුකිරීම සහ පෙරීම සබන්සෑදීම, පොල්ලෙලි පල්කිරීම, කොහු සායම්පෙවීම් (යන්ත්‍රවලින්) පොල්තෙල්හිඳීම, කොහුකෙඳි සෑදීම හා රැස්කරතැබීම, හම්, කටු, සාදනලද පෝර ගබඩාකරතැබීම, හොන්ඛර පහකට වැඩි වශයෙන් උම්බලකඩ තබාගැනීම, කළුගල්, කබුක්ගල් හෝ බොරළු සඳහා වළවල්හෑරීම, සිසිල්බීම සෑදීම මිනිරන් තබාගැනීම සහ සුද්ධකිරීම.

4. ලෝකල්බෝඩ් සභාවේ සභාපතිතැනගෙන් අවසරපත්‍රයක් ලබාගෙන මිස එකී සීමාවතුළ පිහිටි යම්කිසි ඉඩමක හෝ ස්ථානයක අයිතිකාරයකු හෝ පදිංචිකාරයකු නැත්නම් වෙනයම් කෙනෙකු විසින් එවැනි ඉඩමක හෝ ස්ථානයක යම්කිසි අප්‍රසන්නකරවූ හෝ අනතුරය සහිතවූ රක්ෂාවක් හෝ කර්මාන්තයක් නොකළ යුතුයි; නොකරවිය යුතුයි. තවද මින් යම්කිසි ව්‍යවස්ථාවක් හෝ ලෝකල්බෝඩ් සභාවෙ දැනට පවතින වෙන යම් ව්‍යවස්ථාවක් හෝ අනුව කටයුතු නොකරන යමකුට එබඳු අවසරපත්‍රය නොදෙන්නට ලෝකල්බෝඩ් සභාවේ සභාපතිතැනට වැඩිදුරටත් බලය තබනලදී.

එවැනි බලපත්‍රය මන්ත්‍රීසභාගත ආණ්ඩුකාරයානන්වහන්සේගේ අනුදැන්ම ඇතුව ලෝකල්බෝඩ් සභාව විසින් කලින් කල නියමකරන ගෙවිලිවලට යටහත්වේ.

### 1898වේ ලෝකල්බෝඩ් සභා ආඥාපණත.

වර්ෂ 1914යේ අංක 29 දරණ ආඥාපණතෙන් අලුත්වැඩියාකරනලද වර්ෂ 1898වේ ලෝකල්බෝඩ් සභා ආඥාපණතේ 29Aවන වගන්තිය යටතේ මන්ත්‍රීසභාගත ආණ්ඩුකාර උතුමාණන්වහන්සේගේ අනුමතය ඇතුව බණ්ඩාරවෙල ලෝකල්බෝඩ් සභාව විසින් මීට යාකර තිබෙන ලේඛනයේ සඳහන් ගෙවිලි නියමකරනලදී.

උතුමාණන්වහන්සේගේ අණපරිදි,

වර්ෂ 1925ක්වූ මැයි මස 27වෙනි දින කොළඹ මහලේකම්තැනගේ කන්තෝරුවේදීය.

ඊ. බී. ඇලැක්සැන්ඩර්,
වැඩබලන මහලේකම්ට වෙනුවට.

---

### ඉහතකී ලේඛනය.

| | අවුරුද්දකට ගෙවියයුතු ගාස්තුව, රු. |
|---|---|
| තුන්දෙනකට හෝ ඊට වැඩියෙන් ඇති කිරි එළදෙනුන් පට්ටියකට | 3 |
| පෝර සෑදීම ගැන | 100 |
| මස්රොඩු හෝ ලේ උණුකිරීම හෝ වේලීම ගැන | 100 |
| පාන් පුළුස්සන ස්ථානයකට | 20 |
| හම් පදම්කිරීම ගැන | 20 |
| හම්, කටු රටපෝර හෝ රටපෝර සෑදීමට ගන්නා ද්‍රව්‍ය ගෝනියකට වඩා රැස්කර තබාගැනීම ගැන | 10 |
| ගඩොල් නොහොත් උළු සාදන පෝරනුවකට | 50 |
| හුණු පෝරනුවකට | 50 |
| සිසිල්බීම සාදන ස්ථානයකට | 50 |

## ආණ්ඩුවේ ඉඩම් විකිණීම හෝ බදුදීම් සඳහා දැන්වීම්.

**No. 2,808, C. P.**—මධ්‍යම දිසාවේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1925ක්වූ ජූලි මස 6වෙනි දිනවූ සඳුදා පස්වරු 1.30ට මහනුවර කච්චේරියේදී විකුණන්ට හෝ බේරුම්කරදෙන්ට නොහොත් වෙන අන්දමකින් තීන්දුකරන්ට යෙදෙනවා ඇත. මධ්‍යම දිසාවේ මහනුවර පලාතේ පාතදුම්බර කොටසයේ පිහිටා තිබෙන බිම්කැබලි 15ක්.

මුල් සිතියමේ අංක. 7,706. ගම්—පාතදුම්බර, උඩගම්පහ සහ පල්ලේගම්පහ කෝරලවල යටිරාවන සහ මීගම්මන.

ගම—යටිරාවන. අයිතිකමකියන්නා—ආණ්ඩුව.

| අංක. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අන්දම. | මහන, අ. | රූ. | ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|---|---|
| 1 | දුම්බකොළවත්ත .. | වත්තේගම, මීගමවත්තේ පදිංචි මේජර් ඒ. එච්. පේජ් | අවුරුදු විස්සක් පමණ වයස ඇති කොකෝ තිබේ | 0 | 0 | 4 | 20* |
| 2 | එම .. | එම .. | එම .. | 0 | 0 | 0·6 | 20* |
| 3 | එම .. | එම .. | එම .. | 0 | 2 | 6·2 | 20* |
| 5 | එම .. | එම .. | එම .. | 0 | 0 | 2 | 20* |
| | | ගම්—මීගම්මන සහ යටිරාවන. | | | | | |
| 7 | එම .. | වත්තේගම, මීගමවත්තේ පදිංචි මේජර් ඒ. එච්. පේජ් | අවුරුදු විස්සක් පමණ වයස ඇති කොකෝ සහ තණකොළ | 0 | 0 | 37·5 | 20* |
| | | ගම—මීගම්මන. | | | | | |
| 8 | එම .. | වත්තේගම, මීගමවත්තේ පදිංචි මේජර් ඒ. එච්. පේජ් | අවුරුදු විස්සක් පමණ වයස ඇති කොකෝ | 0 | 0 | 4 | 20* |
| 12 | එම .. | එම .. | තණකොළ ඉඩම .. | 0 | 0 | 1 | 20* |
| 13 | එම ... | එම .. | එම .. | 0 | 0 | 2·2 | 20* |
| 15 | එම .. | එම .. | අවුරුදු විස්සක් පමණ වයස ඇති කොකෝ | 0 | 0 | 4·5 | 20* |
| 16 | එම .. | එම .. | එම .. | 0 | 0 | 2 | 20* |
| 17 | එම .. | එම .. | එම .. | 0 | 1 | 17·3 | 20* |
| 18 | එම .. | එම .. | එම .. | 1 | 1 | 29·3 | 20* |
| 19 | එම .. | එම .. | එම .. | 0 | 1 | 23·8 | 20* |
| 20 | එම .. | එම .. | එම .. | 0 | 0 | 30 | 20* |
| 21 | එම .. | එම .. | එම .. | 0 | 0 | 28 | 20* |

* මේ ඉඩම් ප්‍රසිද්ධ වෙන්දේසියේ නොදමා අක්කරය රුපියල් 20 බැගින් වත්තේගම, මීගමවත්තේ පදිංචි මේජර් ඒ. එච්. පේජ් මහතාට විකුණනු ලැබේ. මහලේකම්තුමාරිස් උන්නාන්සේ විසින් ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේට එවනලද නොම්මර 122/6,350 දරණ ලියුමන බලනු.

මෙම ඉඩම් ගැණ වැඩිදුර කාරණ මධ්‍යම දිසාවේ ඒජන්ත උන්නාන්සේගෙන්ද, ඒවායේ සිතියම් සර්වේයර් ජනරාල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිය.

වර්ෂ 1925ක්වූ මැයි මස 26වෙනි දින කොළඹ
මහලේකම්තුමාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

ඒ. බී. ඇලෑක්සැන්ඩර්,
වැඩබලන මහලේකම්තුමාරිස් වම්හ.

---

**No. 4,296, S. P.**—දකුණු දිසාවේ හම්බන්තොට ආණ්ඩුවේ උප ඒජන්ත උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1925ක්වූ ජූලි මස 11වෙනි දිනවූ සෙනසුරාදා දවල් 11ට හම්බන්තොට කච්චේරියේදී වෙන්දේසිකර විකුණන්ට යෙදෙනවා ඇත. දකුණු දිසාවේ හම්බන්තොට පලාතේ මාගම්පත්තුවේ කොට්ඨාශයේ පිහිටා තිබෙන බිම්කැබලි 4ක්.

මුල් සිතියමේ අංක. 12,400. ගම—උතුරු රණකලිය.

| අංක. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අන්දම. | මහන, අ. | රූ. | ප. |
|---|---|---|---|---|---|---|
| 1 | තාල්බින්දිවලගොඩාන .. | — .. | බැද්ද, ගම්සභා පාරට ඉතුරුකරනු තීරෙ | 0 | 3 | 18* |
| 2 | එම .. | — .. | බැද්ද, බෝගහක් තිබේ .. | 1 | 0 | 3* |
| 3 | එම .. | කේ. පී. ඇස්. ඇම්. සෝමසුන්දරම් චෙට්ටි .. | බැද්ද .. | 16 | 3 | 4 |
| 4 | එම .. | එම .. | එම .. | 2 | 3 | 37 |

* විකිනීමට නොවේ.

මෙම ඉඩම්වල තක්සේරු මිල විකිණීමේ වේලාවේදී දැනුම්දෙනවා ඇත.

මෙම ඉඩම් ගැණ වැඩිදුර කාරණ හම්බන්තොට ආණ්ඩුවේ උප ඒජන්ත උන්නාන්සේගෙන්ද, ඒවායේ සිතියම් සර්වේයර් ජනරාල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිය.

වර්ෂ 1925ක්වූ මැයි මස 21වෙනි දින කොළඹ
මහලේකම්තුමාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

ඒ. බී. ඇලෑක්සැන්ඩර්,
වැඩබලන මහලේකම්තුමාරිස් වම්හ.

---

**No. 2,436, N.C. P.**—උතුරු මධ්‍යම දිසාවේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1925ක්වූ ජූලි මස 15වෙනි දිනවූ බදාදා පස්වරු 1.30ට අනුරාධපුරේ කච්චේරියේදී වෙන්දේසිකර විකුණන්ට හෝ බේරුම්කරදෙන්ට නොහොත් වෙන අන්දමකින් තීන්දුකරන්ට යෙදෙනවා ඇත. උතුරු මධ්‍යම දිසාවේ නුවරකලාවිය දිස්ත්‍රික්කුවේ නුවරගම් පලාතේ කනදරකෝරලේ පිහිටා තිබෙන බිම්කැබලි 24ක්.

අන්තිම සිතියමේ අංක. 564. ගම—මිහින්තලේ. අයිතිකමකියන්නා—ආණ්ඩුව.

| අංක. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අන්දම. | මහන. අ. | රූ. | ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|---|---|
| 15o | මිහින්තලේකැලේ .. | ඔබිලිච්, මුදියන්සේ .. | කැලේ .. .. | 0 | 3 | 39 | 105 |
| 15p | එම .. | එම .. | එම .. .. | 0 | 1 | 1 | 105 |

| අංකය. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අන්දම. | මහත, අ. රූ. ප. | අක්කරයක මිල රු. |
|---|---|---|---|---|---|
| 15U | මිහින්තලේකැලේ | — | කැලේ | 0 0 22 | 102 |
| 15Y | එම | ඒ. තෙසිනා මුහම්මදු | වත්තට සුදුසු අලුත එළිකර තිබෙන බිම්, කොටසක පොල් පැළ යනාදිය වවා තිබේ | 2 3 20 | 75 |
| 15Z | එම | සී. එච්. අයි. කරුණාතිලක | වත්තට සුදුසු කැලේ | 1 3 12 | 100 |
| 15AB | එම | ඩබ්ලිව්. සී. මනුවෙල් අප්පුහාමි | එම | 1 0 1 | 101 |

අන්තිම සිතියමේ නො. 752. ගම—කහටගොල්ලෑව.

| අංකය. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අන්දම. | මහත, අ. රූ. ප. | අක්කරයක මිල රු. |
|---|---|---|---|---|---|
| 59E | ගම්මිල්ලෑ කළුමුකලාන නොහොත් කුඩාගම කැලේ | මල්හාමි වෙ. වි. | වීයට සුදුසු කැලේ | 4 0 5 | 20 |

අන්තිම සිතියමේ නො. 754 ගම—කොත්ඩුව.

| අංකය. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අන්දම. | මහත, අ. රූ. ප. | අක්කරයක මිල රු. |
|---|---|---|---|---|---|
| 59B | පූලයාරකොව්වෙල්ලඳ | — | හේන | 2 0 2 | 20 |
| 61 | තිබොල්ගල්ලන්ද | — | එම | 1 2 15 | 20 |
| 28D | කොක්ඹුවකැලේ | කේ. වත්තිහාමි | එම | 1 0 6 | 20 |

අන්තිම සිතියමේ නො. 758 ගම—රුවටපොකුණ.

| අංකය. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අන්දම. | මහත, අ. රූ. ප. | අක්කරයක මිල රු. |
|---|---|---|---|---|---|
| 38A | හම්මිල්ලෑවකැලේ | ඒ. ජී. ඇම්. ගුණතිලක | හේන | 3 0 13 | 20 |

අන්තිම සිතියමේ නො. 766. ගම—ඉහල වලව්විය.

| අංකය. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අන්දම. | මහත, අ. රූ. ප. | අක්කරයක මිල රු. |
|---|---|---|---|---|---|
| 3C | කදුරුගහලඳ නොහොත් ඉහල වලව්වියකටුපත් කැලේ නොහොත් පහල මුඩාගේකැලේ | මිහින්තලේ ඇම්. තොම්මේ සහ වී. මුත්තසියා | වත්තට සුදුසු හේන. කොටසක් එළිකර අස්වද්දා තිබේ | 4 1 4 | 28 |

අන්තිම සිතියමේ නො. 770. ගම—කුරුන්ජන්කුලම.

| අංකය. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අන්දම. | මහත, අ. රූ. ප. | අක්කරයක මිල රු. |
|---|---|---|---|---|---|
| 31D | පාරේවලේහේන නොහොත් කොච්චමාත් කුලම කැලේ | පී නන්හාමි | වීයට සුදුසු හේන | 5 1 25 | 24 |
| 42A | වීරගහලන්ද | කැදුගේ පී. නන්හාමි පිස්කල් පියුන් | හේන | 6 2 18 | 26 |
| 12G | කොච්චමාන්කුලම කැලේ | සී. බී. හෙනෙවිරත්න සහ තවත් කෙනෙක් | ලඳුකැලේ | 0 3 0 | 21·50 |

අන්තිම සිතියමේ නො. 793. ගම—තම්මන්නාව.

| අංකය. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අන්දම. | මහත, අ. රූ. ප. | අක්කරයක මිල රු. |
|---|---|---|---|---|---|
| 21 | මීගහකැලේ | — | කැලේ | 2 0 20 | 21 |
| 33A | තම්මන්නාවකැලේ | ඇස්. නන්හාමි | ලඳුකැලේ | 0 3 20 | 21 |
| 47 | පාරඅද්දර අක්කරේ | — | සුද්දහාමි මොහොට්ටාල විසින් අල්ලාගෙන තිබෙන වත්ත | 0 0 36 | 20 |
| 49 | වාහලගහේන | — | හේන | 0 1 14 | 21 |
| 71C | කිරිමැටියාවේලන්ද | කේ. වී. පී. නැකැත්රාල | මුකලාන | 2 0 6 | 22·50 |
| 2E | පිංපාර ලන්ද නොහොත් තම්මැන්නෑවේකැලේ | යූ. පුන්චිරාල හිටපු වෙ. වි. | හේන | 1 2 7 | 20 |

අන්තිම සිතියමේ නො. 794. ගම—තෙකඩුනුවැව.

| අංකය. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අන්දම. | මහත, අ. රූ. ප. | අක්කරයක මිල රු. |
|---|---|---|---|---|---|
| 92 | කෝන්ගහහේන නොහොත් වාගෙන්හේන | — | හේන | 0 2 27 | 20 |
| 107A | දෙමටවැවකැලේ | ඇස්. පුන්චිරාල සහ තවත් කෙනෙක් | වීයට සුදුසු ලඳුකැලේ | 1 0 6 | 22 |
| 134 | කහටගහලන්දේමුකලාන, තම්මන්නාගොඩමුකලාන | — | කැලේ | 11 3 28 | 23 |

මෙම ඉඩම් සම්බන්ධව වැඩිදුර කාරණ උතුරු මධ්‍යම දිසාවේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේගෙන්ද, ඒවායේ සිතියම් සර්වේයර් ජනරාල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිවේ.

